වයවහාරික තාක්ෂණවේදය - තේ කර්මාන්තය - කඳුකරයට ගොඩ බැස්ස ආගන්තුකයා (සි) - 6 ශ්‍රේණිය

பிரயோகத் தொழினுட்பவியல் - தேயிலைக் கைத்தொழில் - மலைநாட்டுக்கு வந்து சேர்ந்த விருந்தாளி (சி) - தரம் 6

SC06FL1S-2026/335/50,700

# වයවහාරික තාක්ෂණවේදය

## තේ කර්මාන්තය

## කඳුකරයට ගොඩ බැස්ස ආගන්තුකයා



**6 ශ්‍රේණිය**

තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.ac.lk

මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා
ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති
අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ
අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ
අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද වීඩියෝ ඊ - තක්සලාව වෙබ් අඩවිය හා යූටියුබ් චැනලය මඟින් නැරඹිය හැකි ය.
கல்வி வெளியீட்டுத் திணைக்களத்தினால் ஆக்கப்பட்ட வீடியோக்களை e- Thaksalawa இன் இணையத்தளம் மற்றும் youtube அலைவரிசைகளினூடாகப் பார்வையிட முடியும்.
Videos produced by the Educational Publications Department can be viewed via the website and the YouTube channel of e – thaksalawa.

https://www.e-thaksalawa.moe.gov.lk/

https://youtube.com/c/ethaksalawa-official

https://moe.gov.lk/students/nenasa-tv/

අන්තර්ක්‍රියාකාරී පාඩම්, වීඩියෝ පාඩම්, ශ්‍රව්‍ය ඉගෙනුම් ආධාරක, ක්‍රියාකාරකම් පත්‍රිකා, මාර්ගගත ප්‍රශ්නාවලි, පෙළපොත, අධ්‍යාපනික විනෝදාත්මක වැඩසටහන්, මාර්ගගත පාඨමාලා ඇතුළු තවත් අධ්‍යාපනික වැඩසටහන් සඳහා පිවිසෙන්න.
ஊடாடும் பாடங்கள், வீடியோப் பாடங்கள், செவிப்புல கற்றல் உதவிகள், செயலட்டைகள், நிகழ்நிலை வினாக்கள், பாடநூல்கள், கல்விசார் பொழுதுபோக்கு நிகழ்ச்சிகள், நிகழ்நிலை பாடநெறிகள் உட்பட மேலும் கல்விசார் நிகழ்ச்சிகளின் நிமித்தம் பிரவேசியுங்கள்.
Access for interactive lessons, video lessons, audio learning aids, activity sheets, online quizzes, textbooks, educational entertainment programs, online courses and more educational programs.

National Institute of Education
ChannelNIE
ජාතික අධ්‍යාපන ආයතනය
தேசிய கல்வி நிறுவகம்

වීඩියෝ වැඩසටහන්, පෙරහුරු ප්‍රශ්න පත්‍ර, ප්‍රායෝගික පරීක්ෂණ සහ සම්පත් පොත් යනාදී වටිනා අධ්‍යාපනික සම්පත් සඳහා පිවිසෙන්න
வீடியோ நிகழ்ச்சிகள், பயிற்சி வினாத்தாள்கள், செய்முறைச் சோதனைகள், வளநூல்கள் போன்ற பெறுமதியான கல்விவளங்களுக்காக பிரவேசியுங்கள்
Visit us for valuable educational resources; video programs, practice question papers, practical tests and resource books

අප රටේ දරු පරපුර වෙනුවෙන් රජයෙන් ඔබට ලැබුණු මේ මොඩියුලය ලබන වසරේදීත් ඔබ සහෝදර, සහෝදරියනට ලබා දීමට හොඳින් පාවිච්චි කරන්න.

පාසලේ නම : ....................................................................................................................

| | මොඩියුලය ලබා ගත් ශිෂ්‍යයාගේ / ශිෂ්‍යාවගේ නම | ශ්‍රේණිය | පංති භාර ගුරුතුමාගේ / ගුරුතුමියගේ අත්සන |
|---|---|---|---|
| 2026 | | | |
| 2027 | | | |
| 2028 | | | |
| 2029 | | | |

# ව්‍යවහාරික තාක්ෂණවේදය

# තේ කර්මාන්තය

## කඳුකරයට ගොඩ බැස්ස ආගන්තුකයා

## 6 ශ්‍රේණිය

තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
**www.nie.ac.lk**

වායවහාරික තාක්ෂණවේදය
තේ කර්මාන්තය
කඳුකරයට ගොඩ බැස්ස ආගන්තුකයා
6 ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය - 2025

© ජාතික අධ්‍යාපන ආයතනය

සියලු ම හිමිකම් ඇවිරිණි
ප්‍රකාශනය - ජාතික අධ්‍යාපන ආයතනය

ISBN 978-624-5729-62-3

තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.ac.lk

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
දෙල්ගොඩ, කඳුබොඩ, කැරගල පාර, අංක 35/3 දරන ස්ථානයෙහි පිහිටි
සැන්වින් පුද්ගලික සමාගම මගින්
මුද්‍රණය කරවන ලදි.

Published by : National Institute of Education
Printed by : Sanvin (Pvt) Ltd.
No. 35/3, Keragala Road, Kanduboda, Delgoda.

## ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පරිවර්තනීය ප්‍රතිසංස්කරණ ප්‍රයත්නය සෑම ඉගෙනුම්ලාභියකුගේ ම අවශ්‍යතා සපුරාලීම සඳහා තීරණාත්මක මාවතක් අරමුණු කර ඇත.

නිපුණතා පාදක ඉගෙනුම, විචාරාත්මක චින්තනය, නිර්මාණශීලීත්වය, 21වන සියවසේ කුසලතා, තාක්ෂණික නැඹුරුව, සදාචාරාත්මක පුරවැසිභාවය වැනි බොහෝ අංශ අවධාරණය කිරීමට හැකි වන පරිදි විෂය මාලාව, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම සහ තක්සේරු පිළිවෙත් යනාදිය නවීකරණය මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙහි පදනම විය.

අධ්‍යාපනඥයින්, අන්තර්වෛෂයික විද්වතුන්, ගුරුවරුන් සහ විවිධ පාර්ශ්වකරුවන් සමග සහයෝගී සංවාදයක් හරහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් 2026 වර්ෂයේ සිට 1 හා 6 ශ්‍රේණිවල ක්‍රියාත්මක කිරීමට යෝජිත විෂයමාලා හා අදාළ ඉගෙනුම් ද්‍රව්‍යවල ගුණාත්මක බව සහතික කිරීම සඳහා විශේෂ උනන්දුවක් ගෙන කටයුතු කළ ගරු අග්‍රාමාත්‍යතුමිය, අධ්‍යාපන ලේකම්තුමා, අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන්, විෂය භාර නිලධාරීන්, විභාග කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය, අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය දැක්වූ දායකත්වය අති මහත් ය.

එමෙන්ම, මෙම කාර්යයේ දී සුවිශේෂ කැපවීමක් සිදු කළ ජාතික අධ්‍යාපන ආයතනයේ පාලක සභාවේ හා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ කැපවීම ද ගෞරව පූර්වක ස්තුතියෙන් සිහිපත් කරමි. මෙම කාර්යය සාක්ෂාත් කර ගැනීමට ඉමහත් ලෙස කැප වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සියලු කාර්ය මණ්ඩලයට ජාතියේ ගෞරවය හිමි විය යුතු බව සඳහන් කරමි.

**මහාචාර්ය මංජුලා විතානපතිරණ**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
2025.08.11

## අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය

වර්තමානය වන විට ලෝකය ශීඝ්‍ර දියුණුවක් කරා පියනගමින් සිටින්නේ ය. ඒ හා සමගාමී ව පාසල් සිසු සිසුවියන්, නූතන ලෝකයේ අභියෝගවලට මුහුණ දීමට අවශ්‍ය කුසලතාවලින් සන්නද්ධ කරවීම අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුතු සැමදෙනාගේම පරම වගකීමකි. ඒ අනුව යමින් 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක නව විෂයමාලාවට අදාළ මොඩියුල පාදක ඉගෙනුම් ක්‍රමවේදය මෙසේ හඳුන්වා දීමට අවස්ථාව ලැබීම සුවිශේෂ ජයග්‍රහණයක් බව මෙහිලා උදක්ම සඳහන් කළ යුතු ය.

සෑම විෂයක් සඳහා ම විශේෂයෙන් සකස් කර ඇති මෙම ඉගෙනුම් ආධාරක, විචාරශීලී චින්තනය මුවහත් කර ගනිමින් සංකීර්ණ ගැටලුවලට නිර්මාණාත්මක විසඳුම් සොයා ගැනීම, විවිධ කෝණවලින් කරුණු විශ්ලේෂණය කිරීම සහ තර්කානුකූල තීරණ ගැනීම ආදි කුසලතා ශක්තිමත් කර ගැනීම විෂයයෙහි මනා පිටිවහලක් වනු ඇතැයි විශ්වාස කරමි.

ගුණ නැණ සපිරි සිසු පරපුරකගේ සුබ සිහින සැබෑ කරන්නට මෙම ඉගෙනුම් ආධාරක ආලෝකයක් කර ගන්නා ලෙස ඔබ සැමගෙන් ඉල්ලා සිටිමි. මොඩියුල හා ක්‍රියාකාරකම් පොත් සම්පාදනය කිරීමේ විශිෂ්ට කාර්යය සඳහා අප්‍රමාණ දායකත්වයක් සැපයූ සියලු දෙනා වෙත මාගේ කෘතවේදී ස්තුතිය ප්‍රකාශ කරමි.

**ඩී. ඒ. සුහාෂිණී දෙමටගොඩ**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
2025.08.11

# පෙරවදන

සමස්ත පාසල් විෂයමාලාව සඳහා හඳුනගෙන ඇති පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර, නිරන්තරයෙන් වෙනස් වන රටක සහ ලෝකයක, තිරසර සංවර්ධනය කෙරෙහි වන අභියෝග ජය ගැනීමට එම ජාතියට ඇති හැකියාව පිළිබිඹු කරයි. එමෙන් ම කලින් කලට වෙනස් වන ඉල්ලුම්වලට ගැළපෙන සේ පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර ද හඳුනගෙන ඇත. එසේම පවතින පාසල් විෂයමාලාවෙහි විෂයන් නවීකරණය වන අතර ම නව විෂයන් පාසල් විෂයමාලාවට හඳුන්වා දීම සිදු කරයි. මෙම සිදු වන වෙනස්කම්වලට අනුරූප ව ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය ද කාලානුරූප ව සංවර්ධනය විය යුතු ය. ඒ අනුව 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන නව විෂයමාලාවට අදාළ ව සෑම විෂයක් සඳහා ම ඉගෙනුම පාදක ව මොඩියුල හඳුන්වා දී ඇත.

2026 වර්ෂයේ දී 1 සහ 6 ශ්‍රේණි සඳහාත්, 2027 වර්ෂයේ දී 2 සහ 7 ශ්‍රේණි සඳහාත්, 2028 වර්ෂයේ දී 3 සහ 8 ශ්‍රේණි සඳහාත්, 2029 වර්ෂයේ දී 4 සහ 9 ශ්‍රේණි සඳහාත්, 2030 වර්ෂයේ දී 5 ශ්‍රේණිය සඳහාත් ප්‍රාථමික අධ්‍යාපන ශ්‍රේණි සහ කනිෂ්ඨ ද්විතීයක ශ්‍රේණි සඳහා නව විෂයමාලා හඳුන්වා දීමට නියමිත ය. කනිෂ්ඨ ද්විතීයක අධ්‍යාපන අවධියේ සිට නව ඉගෙනුම් ක්‍රමවේද ඇතුළත් මොඩියුල සකස් කර ඇති අතර ඉගෙනුම්ලාභියාට අවශ්‍ය මගපෙන්වීම ගුරුවරයාගෙන් බලාපොරොත්තු වන අතර ස්වයං ඉගෙනුම සඳහා අවශ්‍ය පරිසරය මෙම මොඩියුලවලින් සලසා ඇත. ශිෂ්‍යයන්ට අවශ්‍ය සංකල්ප පිළිබඳ දැනුම මෙන් ම ලබා ගත් දැනුම භාවිත අවස්ථාවන්ට යොමු කර ශිෂ්‍ය හැකියා සංවර්ධනයට මෙම මොඩියුල බෙහෙවින් උපකාරී වන බව අපගේ විශ්වාසයයි. 21 වන සියවසේ කුසලතා වන සාක්ෂරතා, අන්තර්පුද්ගල හැකියා සහ අගයන් ආදිය මනා ලෙස ශක්තිමත් කිරීමට මෙම මොඩියුලවලින් ලැබෙන ඉගෙනුම ඉවහල් වනු ඇත.

නව තාක්ෂණය භාවිතයට අවශ්‍ය මග පෙන්වීම සෑම මොඩියුලයක ම දක්වා ඇත. තව ද ශිෂ්‍යයන්ට තමා ළඟා කර ගත් කාර්ය සාධන සහ අධ්‍යාපන අරමුණු පිළිබඳ ව විනිවිදභාවයෙන් ඇගයීමට අවශ්‍ය තක්සේරු උපකරණ ලබා දෙනු ඇත. සෑම විට ම නව හැකියා, දැනුම භාවිත අවස්ථාව සඳහා යොදවමින් යථාර්ථවාදී ඉගෙනුමකට අවශ්‍ය මග පෙන්වීම ලැබෙන ආකාරයෙන් මොඩියුල නිර්මාණය කර ඇත. විශේෂයෙන් ම මොඩියුල පාදක ඉගෙනුම් ක්‍රමවේද සකස් කිරීමට මූලික කටයුතු කළ අධ්‍යාපන අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරුන්ගේ හා ජාතික අධ්‍යාපන ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ සේවාව ඉතා අගය කරමි. තව ද මෙම මොඩියුල සකස් කිරීමේ දී දායක වූ ආයතනයේ සියලු ම කාර්ය මණ්ඩලයට ද ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, අධ්‍යක්ෂවරුන් මෙන් ම රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ලබා දෙන ලද දායකත්වය මොඩියුල ගුණාත්මක ව ඉහළ මට්ටමකට සංවර්ධනය වීමට ඉවහල් වූ බව ඉතා සතුටින් සිහිපත් කරමි. මෙම මොඩියුල පරිහරණය කිරීමේ දී ඔබ ලබන අද්දැකීම් සහ යෝජනා අපහට ඉතාමත් වැදගත් වන බැවින් ඉදිරි මොඩියුල සංවර්ධනය කිරීමට ඔබගේ අදහස් හා යෝජනා අප වෙත ලබා දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

**කේ. රංජිත් පත්මසිරි**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
2025.08.08

**උපදේශකත්වය** : මහාචාර්ය මංජුලා විතානපතිරණ (PhD)
අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
: කේ. රංජිත් පත්මසිරි
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

**අධීක්ෂණය** : ආචාර්ය කේ. ජී. වසන්ත කටුකුරුන්ද
අධ්‍යක්ෂ, තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය

**සම්බන්ධීකරණය** : ආචාර්ය එල්. ඩබ්. ආර්. ද. අල්විස් (විශ්‍රාමික)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව
: පී. නිපුන පෙරේරා
සහකාර කථිකාචාර්ය, තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**ලේඛක මණ්ඩලය** : තාරකා සමාලි සේනාරත්න
ශ්‍රී ලංකා ගුරු සේවය, බප/පිළි/ කොතලාවලපුර මහා විද්‍යාලය

: ඩබ්ලිව්. ඒ. එම්. ශිහාරා වික්‍රමආරච්චි
ශ්‍රී ලංකා ගුරු සේවය, මප/හැ/ ගිනිගත්හේන මධ්‍ය විද්‍යාලය

**සංස්කරණය**

**අභ්‍යන්තර** : පී. නිපුන පෙරේරා
සහකාර කථිකාචාර්ය, තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**බාහිර** : යජිත් ද සිල්වා
ප්‍රධාන මෙහෙයුම් නිලධාරි, ශ්‍රී ලංකා පාම් ඔයිල් කර්මාන්ත සංගමය

: ආනන්ද ප්‍රනාන්දු
අධ්‍යක්ෂ, මස්කෙළිය, කෑගල්ල, නමුණුකුළ වැවිලි සමාගම

**භාෂා සංස්කරණය** : මනෝරී ස්වර්ණපාලී
ශ්‍රී ලංකා ගුරු සේවය, බප/හෝ/සීතාවක ජාතික පාසල

**පිටකවරය හා**
**පිටු සැකසීම** : ගයත්‍රී ඉරේෂිකා
ශ්‍රී ලංකා ගුරු සේවය, ශ්‍රී සුමංගල මහා විද්‍යාලය, වාරියපොළ.

## හැඳින්වීම

විසි එක්වන සියවසේ අභියෝග හමුවේ අපි තාක්ෂණයේ විවිධ පරිණාමන අවධි පසු කරමින් පස්වන කාර්මික විප්ලවයට ද ළඟා වෙමින් සිටිමු. තාක්ෂණික නවෝත්පාදන මිනිසාගේ විවිධ අවශ්‍යතා හා උවමනා සපුරාලීමට උපකාරී වන අතර එය රටක ආර්ථික හා සමාජයීය සන්දර්භයට සෘජු බලපෑමක් ඇති කරයි. ඒ අනුව, වර්තමාන සහ අනාගත තාක්ෂණික අභියෝගවලට මුහුණ දිය හැකි වැඩ ලෝකයට ගැළපෙන පුරවැසියකු බිහි කිරීම කාලීන අවශ්‍යතාවක් වී ඇත. ඊට අදාළ ව සිසුන් තුළ දැනුම, ආකල්ප, කුසලතා සහ මානසිකත්වය වර්ධනය කළ යුතු ය. ඒ අනුව, නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළ තාක්ෂණ අධ්‍යාපනය විෂයමාලාව ද වෙනස්කම්වලට ලක් කර ඇත.

කනිෂ්ඨ ද්විතීයික (6-9 ශ්‍රේණි) අධ්‍යාපන අවධියේ දී සෑම සිසුවකු විසින් ම අනිවාර්යයෙන් හැදෑරිය යුතු සමෝධානිත තාක්ෂණ විෂයයක් වන "ජීවිතය සඳහා තාක්ෂණවේදය" හඳුන්වා දී ඇති අතර එමගින් සිසුන් තුළ මූලික ලෙස තාක්ෂණ කුසලතා සංවර්ධනය සඳහා පදනමක් මෙන් ම ප්‍රාරම්භක වෘත්තීය කුසලතා සංවර්ධනයට පුළුල් ඉඩකඩක් ද ලබා දෙයි. ජ්‍යෙෂ්ඨ ද්විතීයික ශ්‍රේණි (10-11 ශ්‍රේණි) සඳහා තාක්ෂණවේදය විෂය ක්ෂේත්‍රය හා වෘත්තීය අධ්‍යයනය යන විෂය ක්ෂේත්‍ර දෙක හඳුන්වා දී ඇත.

තව ද, ගෝලීය රැකියා වෙළෙඳපොළට අවශ්‍ය විවිධ වෘත්තීය කුසලතා සංවර්ධනය කිරීමේ කාලීන අවශ්‍යතාව හඳුනා ගනිමින් 6 සිට 9 ශ්‍රේණි තෙක් "ව්‍යවහාරික තාක්ෂණවේදය" විෂයය කාණ්ඩය යටතේ ප්‍රාදේශීය සම්පත් කෙරෙහි ද අවධානය යොමු කරමින් වැඩිදුර ඉගෙනුම් මොඩියුල තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී ඇත. ප්‍රාදේශීය සම්පත් හා ස්වකීය ලැදියා අනුව මෙම වැඩිදුර ඉගෙනුම් මොඩියුල සිසුන්ට තෝරා ගැනීමේ අවකාශ ඇත. ඊට අමතර ව වෘත්තීය අධ්‍යයනයට යොමු වීමට අදාළ මොඩියුල ද හඳුන්වා දෙනු ලැබේ.

ඉහත අරමුණු පෙරදැරි ව සකස් කරන ලද "තේ කර්මාන්තය" විෂයයට අදාළ "කඳුකරයට ගොඩ බැස්ස ආගන්තුකයා" වැඩිදුර අධ්‍යයන මොඩියුලය සකසා ඇත.

මෙම මොඩියුල සකස් කිරීමේ ජාතික කර්තව්‍යයට සම්පත් දායකත්වයෙන් සහ නන් අයුරින් සහාය දැක් වූ සියලු දෙනාට ද, අන්තර්ජාල වෙබ් අඩවි, විවිධ ග්‍රන්ථ, You Tube නාලිකා, QR කේත ආදී පරිශීලන මූලාශ්‍රවල බුද්ධිමය දේපළවල හිමිකාරීත්වයට ද මාගේ ගෞරවනීය ස්තුතිය පුද කරමි.

**ආචාර්ය වසන්ත කටුකුරුන්ද**
අධ්‍යක්ෂ
තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

## පටුන


| | |
|---|---|
| ඉගෙනුම් පල | 1 |
| අකුරු කරන්නට කලින් | 1 |
| පාරිභාෂික වචන මාලාව | 3 |
| පළමුව ආරක්ෂාව | 4 |
| මතකය අවදි කර ගනිමු | 5 |
| 01. තේ දල්ලේ කතන්දරේ | 7 |
| 1.1 තේ කොහොමද මෙහෙට ආවේ? එයාගේ හැඩරුව කොහොම ද? | 8 |
| 1.2 තේ පැළයේ විදු තොරතුරු | 15 |
| 02. එන්න අපි තේ හදමු | 19 |
| 2.1 තේ හදනවා තේ බෙදනවා | 19 |
| 2.2 තේවල රස ගුණ වැඩි කරමු ද? | 22 |
| 2.3 තේ දල්ලයි සුව අරණයි | 25 |
| 03. කොහේද මේ තේ වවන්නේ? | 30 |
| ඉදිරි ගමනට අත්වැලක් | 39 |

## ඉගෙනුම් පල

- අනෙකුත් ශාක අතරින් තේ ශාකය වෙන් කර හඳුනා ගැනීම සඳහා එහි ස්වභාවය, රූප විද්‍යාත්මක ලක්ෂණ සහ උද්භිද විද්‍යාත්මක ලක්ෂණ ගවේෂණය කරයි.
- ශ්‍රී ලංකාවේ හා ලෝකයේ තේ වගාව සඳහා වඩාත් උචිත ප්‍රදේශ හා රටවල් හඳුනා ගැනීමට තේ වගාව සඳහා යෝග්‍ය ප්‍රශස්ත දේශගුණික සාධක විමර්ශනය කරයි.
- කළු තේ හා අගය එකතු කළ තේ පානයක් පිළියෙල කිරීමට යෝග්‍ය තාක්ෂණය, අවශ්‍ය උපකරණ හා ද්‍රව්‍ය භාවිත කරයි.
- තේ පානය කිරීමෙන් ලැබෙන සෞඛ්‍යමය ප්‍රතිලාභ පිළිබඳ ගවේෂණය කරයි.

## අකුරු කරන්නට කලින් .....

ආදරණීය දුවේ, පුතේ,

- මෙම මොඩියුලය ඔබේ ස්වාධීන ඉගෙනීම සඳහා අර්ථවත් අව්‍යාජ ඉගෙනුමකට මග පෑදීමට නිර්මාණය කර ඇති අතර මොඩියුලයේ පරිච්ඡේද තුන ඔස්සේ ඔබගේ දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය කර ගැනීමට අවස්ථාව ලබා දෙනු ඇත.
- මෙම මොඩියුලයට **අවතීර්ණ වීමට පෙර** තේ වගාව පිළිබඳ ඔබ අසා ඇති දෑ පිළිබඳ මතකය අවදි කර ගැනීමට **"මතකය අවදි කර ගනිමු"** යටතේ ඇති ක්‍රියාකාරකමෙහි නිරත වන්න.
- මොඩියුලයේ දැනුම තහවුරු කර ගැනීම සඳහා එක් එක් පරිච්ඡේදයේ ඇති සියලු ම ක්‍රියාකාරකම් අදාළ උපදෙස් අනුව සිදු කරන්න.
- එක් එක් ක්‍රියාකාරකම කිරීමට ප්‍රථම ඒ සඳහා අවශ්‍ය සංකල්ප පිළිබඳව ගුරුභවතාගේ ද සහාය ඇතුව අධ්‍යයනය කරන්න.

- ක්‍රියාකාරකම අවසානයේ දී තමා සොයා ගත් දෑ තම යහළුවන් හා ගුරුභවතා සමග සාකච්ඡා කරන්න.

- මෙම මොඩියුලය තුළ ඔබට අවශ්‍ය තොරතුරු ඉතා පහසුවෙන් හා කාර්යක්ෂම ව ලබා ගැනීම සඳහා මූලාශ්‍ර යොමුවන් ලබා දී ඇත. (QR Code). ඒ සඳහා යොමු වීම සඳහා තාක්ෂණික උපකරණ භාවිතයේ දී වැඩිහිටියන්ගේ මග පෙන්වීම හා අනුදැනුම යටතේ සිදු කරන්න.

- තම ඉගෙනුම් ක්‍රියාවලියේ දී අතිරේක පොත් පරිශීලනය සහ අන්තර්ජාලය භාවිතය සඳහා අවශ්‍ය පාරිභාෂික වචන මොඩියුලය ආරම්භයේ හා එක් එක් පරිච්ඡේදය යටතේ දක්වා ඇත.

- මෙහි සඳහන් ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිදු කිරීමට පාසලේ දී අත්දැකීම් ලබා ගැනීම සඳහා මෙන් ම එම ක්‍රියාකරකම් වඩාත් සාර්ථක ව සිදු කිරීමට සහ නිරීක්ෂණය සඳහා අදාළ ස්ථාන හා ආයතන පිළිබඳ අත්දැකීම් ලබා ගැනීමට ක්ෂේත්‍ර චාරිකා සංවිධානය සඳහා ගුරු හා වැඩිහිටි මග පෙන්වීම ලබා ගන්න.

- ක්‍රියාකාරී ඉගෙන ගන්නෙකු ලෙස මෙහි යෝජනා කර ඇති ස්වයං ක්‍රියාකාරකම් සහ කණ්ඩායම් ක්‍රියාකාරකම්වල සාර්ථක ව නිරත වන්න. ඒ ඇසුරෙන් ස්වයං ඇගයීමේ (Self Assessment) සහ සමපදස්ථයින් (Peer Assessment) ඇගයීමේ නිරත වන්න.

- මොඩියුලය අවසානයේ **"ඉදිරි ගමනට අත්වැලක්"** යටතේ ලබා දී ඇති පසු පරීක්ෂණයට තනිව ම පිළිතුරු සපයා මිතුරන් සමඟ එම පිළිතුරු සාකච්ඡා කරන්න. ඒ ඇසුරෙන් ස්වයං ඇගයීමේ නිරත වන්න.

- අපට අපගේ කුසලතා වර්ධනය කර ගැනීමට අවශ්‍ය මග පෙන්වීම මෙයින් ලබා ගත හැකිය. ඒ ඇසුරෙන් අපට නව නිර්මාණ කළ හැකි ය. එබැවින් මෙම මොඩියුලය මඟින් ඉගෙන ගන්නෙකු ලෙස ඔබට ඔබේ හැකියාවන් හා අදාළ කුසලතා වර්ධනය කර ගැනීමට අවශ්‍ය මග පෙන්වීම කරනු ලැබේ.

- මෙම මොඩියුලය සඳහා කාලය පැය 10 කි.

## පාරිභාෂික වචන මාලාව

| | |
|---|---|
| තේ දල්ල | Tea Leaf |
| තේ බීජ | Tea Seeds |
| මූල පද්ධතිය | Root system |
| හරස්කඩ | Cross section |
| නාරටි වින්‍යාසය | Vein System |
| විද්‍යාත්මක නාමය | Scientific name |
| කුලය | Family |
| නිජබිම | Origin |
| විශේෂ ලක්ෂණ | Special featues |
| තේ වර්ග | Tea types |
| කළු තේ | Black Tea |
| අගය එකතු කිරීම | Value addition |
| රස කළ තේ | Flavoured tea |
| සෞඛ්‍යමය ප්‍රතිලාභ | Health benefit |
| ඉඟුරු | Ginger |
| ගොරකා | Garcenia |

## පළමු ව ආරක්ෂාව

| ක්‍රියාකාරකම | විය හැකි අනතුරු |
|---|---|
| ක්‍රියාකාරකම **1.1** | ක්‍රියාකාරකම **1.1** ට අදාළ ක්ෂේත්‍ර චාරිකාවට සහභාගි වීමේ දී කුඩැල්ලන් හා දෙබරුන් ආදී කෘමීන්ගෙන් වෙන හානි පිළිබඳව සැලකිලිමත් වන්න. |
| ක්‍රියාකාරකම **2.1** | ක්‍රියාකාරකම **2.1** ට අදාළ ව තේ පානයක් සෑදීමේ දී උණු වතුර යොදා ගන්නා බැවින් නිතර ම සැලකිල්ලෙන් ක්‍රියාකාරකම් හි යෙදෙන්න. ඒප්‍රන පළඳින්න. |
| ක්‍රියාකාරකම් **2.2** | ක්‍රියාකාරකම **2.2** ට අදාළ අගය එකතු කළ තේ පානයන් සැකසීමේ දී ඔබ එකතු කරන ද්‍රව්‍යවල ගුණාත්මක බව හා ප්‍රමාණාත්මක බව පිළිබඳව සැලකිලිමත් වන්න. උදාහරණ ලෙස රෝස පෙති ,පිච්ච පොහොට්ටු තුළ කෘමි සතුන් සිටිය හැක. ඒවා පිරිසිදු කර තේ පානයන් සඳහා අගය එකතු කිරීමට යොදා ගන්න. |



## මතකය අවදි කර ගනිමු

ආදරණීය දුවේ, පුතේ, තේ වගාව පිළිබඳ ඔබ අසා ඇති දෑ පිළිබඳ මතකය අවදි කර ගැනීමට දී ඇති ප්‍රශ්නවලට අපි දැන් පිළිතුරු ලියමු.

01. ශ්‍රී ලංකාවේ තේ වගාව සඳහා වඩාත් ප්‍රචලිත ප්‍රදේශය කුමක් ද ?

..........................................................................................................

02. ශ්‍රී ලංකාවට අනන්‍ය තේ සන්නාම නාමය කුමක් ද ?

..........................................................................................................

03. ශ්‍රී ලාංකික තේවලට ආවේණික ලාංඡනය ඇඳ දක්වන්න.

04. ඔබට වෙළඳ පොළේ හමු වන තේ නිෂ්පාදන දෙකක් සඳහන් කරන්න.

..........................................................................................................

..........................................................................................................

05. ඔබ නිවසේ දී තේ පානයේ රස වැඩි කර ගැනීමට එක් කරන ද්‍රව්‍ය දෙකක් ලියන්න.

..........................................................................................................

..........................................................................................................



පුංචි මමයි දක්ෂයා
ලොවම රසින් පුරවනා
දුප්පතාගේ හිතවතා
පුංචි දල්ල මම තමා...

චීන රටේ ඉපදිලා
උඩරටටත් ඇවිල්ලා
විදේශයෙන් සල්ලි ගෙනෙන
පුංචි පැළය මම තමා...

ශරීර බර අඩු කරන්න
හදවත සතුටින් තියන්න
ශරීරයට ශක්තිය දෙන
තේ පානය මම තමා....





# 01. තේ දල්ලේ කතන්දරේ

මෙම ඒකකය අවසානයේ දී

- තේ ශාකයේ කොටස් ගවේෂණය කිරීමට,
- තේ ශාකයේ ව්‍යුහය හා කොටස් හඳුනා ගෙන රූප සටහන් ඇඳීමට,
- තේ ශාකයේ ඉංග්‍රීසි නාමය, කුලය හා නිජබිම ප්‍රකාශ කිරීමට,
- තේ ශාකයේ ඉතිහාසය පිළිබඳ විස්තර කිරීමට

ඔබට හැකියාව ලැබෙනු ඇත.

## 1.1 තේ කොහොම ද මෙහෙට ආවේ ?
## එයාගෙ හැඩරුව කොහොම ද ?

### හැඳින්වීම



ආදරණීය දුවේ, පුතේ, තේ කියන්නේ ශ්‍රී ලංකාවේ තිබෙන ප්‍රධාන වැවිලි බෝගවලින් එකක් කියලා ඔයාලා අහලා ඇති. අතීතයේ සිට ම ශ්‍රී ලංකාව තේ අපනයනය කරලා ගොඩක් විදේශ මුදල් උපයා ගන්නවා. තේ වගාව නිසා ගොඩක් රැකියාත් බිහි වෙලා තියෙනවා.

ඔයාලා දන්නව ද ? තේ ගස මුලින් ම සොයා ගත්තේ චීනයෙන්. ඒ ගැන ලස්සන කතාවකුත් තියෙනවා. ඔන්න අහගන්නකෝ.

එකමත් එක කාලෙක චීනයේ ජීවත් වෙලා තියෙනවාලු Shen Nung කියලා අධිරාජවරයෙක්. දවසක් එයා ගමනක් යද්දි ගිමන් නිවා ගන්න ගහක් යට නැවතුනා. ඒ අතරේ එයාගෙ සේවකයා වතුර මුට්ටියක් රත් වෙන්න තියලා. ඒ වතුර මුට්ටියට ගහෙන් කොළ කිහිපයක් වැටිලා. ඒක අධිරාජවරයා දැකලා නැහැ. කොහොම හරි එයා අර මුට්ටියෙන් වතුර බීලා. එතකොට ඒ වතුරවල අමුතු රසයක් දැනිලා. ඒ මොකද කියලා හොයලා බලද්දි අධිරාජවරයා දැකලා අර කොළ ටික. ඉතින් ඊට පස්සේ ඉඳන් තේ චීනයේ ඉතා ජනප්‍රිය වුණා ලු. ඉතින් ඒ නිසා තේ ශාකය ලෝකයට හඳුන්වා දීමේ ගෞරවය හිමි වෙන්නේ Shen Nung කියන චීන අධිරාජවරයාට.

ශ්‍රී ලංකාවට තේ ගස ගෙනාවේ ඉංග්‍රීසි ජාතිකයන් විසින්. ඉංග්‍රීසි ජාතික ජේම්ස් ටේලර් කියන පුද්ගලයා තමයි තේ ශාකය ලංකාවට ගෙනාවේ. මුලින් ම ලංකාවේ තේ වගාව ආරම්භ කළේ මහනුවර ලූල්කඳුර වතුයායේ. එය සිදුවුණේ වර්ෂ 1867 දී.

තේ ශාකයේ හැඩය වයින් වීදුරුවක් වගේ කියලා තමයි කියන්නේ.



1.1 රූපය: Shen Nung නම් චීන අධිරාජයා



1.2 රූපය: ශ්‍රී ලංකාවේ තේ වගාවේ පියා James Taylor

**ඔබ දන්නවා ද ?**

**ඉංග්‍රීසි ජාතිකයන් විසින් ශ්‍රී ලංකාවේ වගා කළ කෝපි ශාක, කෝපි මළකඩ රෝගය (cofee leaf rust) නම් රෝගය වැළඳී විනාශ වූ නිසා ඔවුන් තේ වගාවට යොමු වුණා.**



1.3 රූපය: *Camellia sinensis* තේ
විශේෂයේ මල්



1.4 රූපය: *Camellia japonica* නම් තේ
විශේෂයේ මල්



1.5 රූපය: තේ බීජ (Tea Seeds)



1.6 රූපය: තේ ශාකයේ පත්‍ර (Tea Leaves)



## ක්‍රියාකාරකම - 1.1

දුවේ, පුතේ, ඔබ ප්‍රදේශයේ ඇති තේ වත්තක් නැරඹීම සඳහා ක්ෂේත්‍ර චාරිකාවක් යන්න.

01. ඔබ විසින් ක්ෂේත්‍රයට ගොස් සපයා ගත් තේ පත්‍ර, තේ මල්, මූල පද්ධතිය, තේ ඵලය හා එහි හරස්කඩ දැක්වෙන පින්තූර පහත කොටු තුළ අඳින්න.

තේ ශාකයේ පත්‍ර

තේ පත්‍රවල නාරටි වින්‍යාසය

තේ ශාකයේ මල්

තේ ශාකයේ මූල පද්ධතිය

තේ ශාකයේ ඵලය හා එහි හරස්කඩ

තේ ශාකයේ හැඩය

02. ඔබගේ නිර්මාණාත්මක හැකියාවන් යොදා ගනිමින් තේ වගාවේ ඉතිහාසය හා සම්බන්ධ කතා පුවත නිර්මාණාත්මක ව ඉදිරිපත් කරන්න.

උදාහරණ ; නාට්‍යයක් හෝ චිත්‍රයක් (නාට්‍යයේ දෙබස් හෝ චිත්‍රය සඳහා පහත කොටුව භාවිත කරන්න.)


## 1.2 තේ පැළයේ විදු තොරතුරු

**හැඳින්වීම**

දුවේ, පුතේ, ඔයාලා හැමෝටම ම උප්පැන්න සහතිකයක් තියෙනවා නේ ද? ඒකෙ ඔයාලගෙ වැදගත් විස්තර ගොඩාක් තියෙනවා නේ ද ? අන්න ඒ වගේ තේ ශාකයටත් තියෙනවා එයා ගැන වැදගත් විස්තර. අපි ඒවාට කියනවා විද්‍යාත්මක තොරතුරු කියලා.

**විද්‍යාත්මක නාමය**

අපි ශාකවලට එක එක නම් කියනවා සිංහලෙන් එක නමක්, දෙමළෙන් තවත් නමක්. ඒත් ලෝකෙ හැමෝට ම ඒ ශාකය හඳුනා ගන්න පුළුවන් වෙන්න එක නමක් දීලා තියෙනවා. අපි ඒකට කියන්නේ විද්‍යාත්මක නාමය කියලා.






https://en.wikipedia.org/wiki/Camellia_sinensis

**ඔබ දන්නවා ද ?**
**කප්පාදු නො කළ තේ ශාකයක් මීටර විස්සක් විතර ඉහළට වැවෙනවා.**





## ක්‍රියාකාරකම - 1.2

1. තේ ශාකයේ උද්භිද විද්‍යාත්මක ලක්ෂණවලට අදාළ කරුණු අන්තර්ජාලය සහ පුස්තකාලය ඇසුරින් සොයා පහත හිස්තැන් සම්පූර්ණ කරන්න.



- ❖ නිජබිම -.............................................................
- ❖ කුලය -.............................................................
- ❖ විශේෂ ලක්ෂණ -.............................................................

.............................................................

.............................................................

.............................................................

2. ඉහත ඔබ සඳහන් කළ කරුණු ඇතුළත් පෝස්ටරයක් නිර්මාණය කර පන්තියට ඉදිරිපත් කරන්න.

## දැන් මට පුළුවන් ...

ක්‍රියාකාරකම අවසානයේ පහත සඳහන් කර ඇති එක් එක් ක්‍රියාව ඔබ සිදු කර ඇති ප්‍රමාණය පිළිබඳ ඔබගේ අදහස අනුව ඊට ඉදිරියෙන් ඇති හිස්තැන මත √ ලකුණ යොදන්න.


සංවර්ධනය විය යුතු ය  සෑහීමකට පත් විය හැකි ය  සතුටුදායකයි

| | | | |
|---|---|---|---|
| තේ ශාකයේ සියලු ම කොටස් හඳුනා ගැනීමට ඔබට පුළුවන් ද? | | | |
| තේ ශාකයේ ඉංග්‍රීසි නාමය, කුලය හා නිජබිම ප්‍රකාශ කිරීමට ඔබට පුළුවන් ද ? | | | |
| තේ ශාකයේ ඉතිහාසය විස්තර කිරීමට ඔබට පුළුවන් ද ? | | | |

❖ ක්‍රියාකාරකම අවසානයේ ඔබගේ මොඩියුලය මිතුරෙකුට හෝ මිතුරියකට ලබා දී පහත සඳහන් කර ඇති එක් එක් ක්‍රියාව ඔබ සිදු කර ඇති ප්‍රමාණය පිළිබඳ ඔහුගේ/ ඇයගේ අදහස අනුව ඊට ඉදිරියෙන් ඇති ☆ ලකුණක් වටා රවුමක් අඳින්න.

★ සංවර්ධනය විය යුතු ය.  ★ සෑහීමකට පත් විය හැකි ය.

★ සතුටුදායකයි.  ★ ඉතා සතුටුදායකයි.

| | |
|---|---|
| ඔබගේ මිතුරා/මිතුරිය තේ ශාකයේ කොටස් හයක් නම් කළා ද? |  |
| ඔබගේ මිතුරා/මිතුරිය නිවැරදි ව තේ ශාකයේ විශේෂ ලක්ෂණ ලියා දක්වා තිබේ ද? |  |
| ඔබගේ මිතුරා/මිතුරිය තේ ශාකයේ කුලය හා නිජබිම නම් කර තිබේ ද? |  |
| ඔබගේ මිතුරා/මිතුරිය තේ ශාකයේ ඉතිහාසය පිළිබඳ කතා පුවත නිර්මාණාත්මක ලෙස ඉදිරිපත් කළා ද? |  |
| ඔබගේ මිතුරා/මිතුරිය කණ්ඩායම් හැගිමෙන් යුතු ව අනෙකුත් අය සමඟ සහයෝගයෙන් වැඩ කටයුතු සිදු කළා ද? |  |



## 02. එන්න අපි තේ හදමු...

මෙම ඒකකය අවසානයේ දී

- තේ කෝප්පයක් සෑදීමට අවශ්‍ය උපකරණ හඳුනා ගෙන, තේ කෝප්පයක් නිවැරදි ව පිළියෙල කිරීමට,
- තේ සෑදීමට අවශ්‍ය උණු ජලයේ ප්‍රශස්ත උෂ්ණත්වය, තේ කොළ ප්‍රමාණය, සීනි ප්‍රමාණය තීරණය කිරීමට,
- තේ පානයේ රස ගුණ දියුණු කිරීමට විවිධ ද්‍රව්‍ය එකතු කොට අගය එකතු කළ තේ පානයක් සෑදීමට,
- තේ පානය කිරීමෙන් ලැබෙන සෞඛ්‍යමය ප්‍රතිලාභ විස්තර කිරීමට

ඔබට හැකියාවක් ලැබෙනු ඇත.

### 2.1 තේ හදනවා තේ බෙදනවා.

හැඳින්වීම

තේ කියන්නේ උණුසුම් වතුරෙන් සාදා ගන්නා ඉතා අනගි පානයක්. ලෝකයේ මිනිස්සු වතුරට අමතර ව වැඩිපුර ම බොන්නේ තේ.






Open Me
https://www.youtube.com/watch?v=tkBm6OSakpE

අපිට විවිධ තේ වර්ග වෙළඳ පොළේ දී හමු වෙනවා. ඒවා කළු තේ, හරිත තේ වගේ විවිධ නම් වලින් හඳුන්වනවා. ඒත් ලංකාවේ ගොඩක් අය කැමති කළු තේවලට. මේ තේ වර්ගවල රස එකිනෙකට වෙනස්.

තේ වර්ග නිපදවන ප්‍රදේශ අනුව කොටස් තුනකට බෙදන්න පුළුවන්. ඒ උඩරට තේ, පහතරට තේ සහ මැදරට තේ කියලා. තේ ශාක වැවෙන ප්‍රදේශ අනුව තේ වර්ගවල රසයත් වෙනස් වෙනවා. පහතරට තේවල වැඩි කහට රසයක් තියෙනවා. උඩරට තේවල කහට රසය ඊට වඩා අඩුයි.



2.1 රූපය: කළු තේ හෙවත් Black tea



2.2 රූපය: හරිත තේ හෙවත් Green tea



2.3 රූපය: Silver tips



2.4 රූපය: Golden tips



## ක්‍රියාකාරකම - 2.1

❖ දුවේ, පුතේ, අපි දැන් ඔබ විසින් සපයා ගත් තේ සාම්පල සහ අවශ්‍ය උපකරණ සොයාගෙන පන්ති කාමරය තුළ හෝ ගෘහ විද්‍යාගාරය තුළ තේ පානයක් පිළියෙල කරමු.

❖ ඒවායේ රස පිළිබඳව මිතුරන් සමඟ සාකච්ඡා කර පහත වගුව සම්පූර්ණ කරන්න.

| තේ සාම්පලය | කහට රස වැඩි වීම හෝ අඩු වීම | සීනි රස වැඩි වීම හෝ අඩු වීම | තේ පානයේ රස්නය |
|---|---|---|---|
| 01 | | | |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |
| 05 | | | |

❖ දැන් ඔබ ගුරුවරයා සමඟ නිවැරදි ව තේ පානයක් සාදන අයුරු සාකච්ඡා කරන්න.
- අවශ්‍ය උපකරණ
- වතුර නටන උෂ්ණත්වය
- යෙදිය යුතු තේ කොළ හා සීනි ප්‍රමාණය
- රස වැඩි කර ගැනීමට අමතර ව යොදන ද්‍රව්‍ය

❖ ඔබ සාදා ගත් තේ පානය නිර්මාණාත්මක අයුරින් පන්තිය ඉදිරියේ පිළිගන්වන්න.

❖ ඔබ රැගෙන ආ සියලු ම තේ සාම්පලවලින් තේ පිළියෙල කර ඒවායේ රසයන් සංසන්දනය කරන්න.

## 2.2 තේවල රස ගුණ වැඩි කරමු ද...?



**හැඳින්වීම**

තේවල රස සහ ගුණ වැඩි කර ගන්න විවිධ ද්‍රව්‍ය එකතු කරනවා. මතක ද ගෙදර තේ හදද්දි සමහර වෙලාවට ඉගුරු දානවා? ගොඩක් වෙලාවට මෙහෙම විවිධ ද්‍රව්‍ය එකතු කිරීම මගින් තේ සාම්පලයන්හි ඇතුළත් රස වෙනස් කරන්නෙ කළු තේ හෝ හරිත තේවල. අපි ඒකට කියනවා තේවල අගය වැඩි කරනවා (Value Adddition) කියලා. වෙළඳ පොළෙහි විවිධ අගය එකතු කළ තේ නිෂ්පාදන අපිට දැක ගන්න පුළුවන්.

බලන්නකෝ පහළ තියෙනවා තේවල රස ගුණ වැඩි කර ගැනීමට එකතු කර ගන්න පුළුවන් ද්‍රව්‍ය.



2.5 රූපය: ඉඟුරු



2.6 රූපය: විවිධ පලතුරු වර්ග (දොඩම්)



2.7 රූපය: පිච්ච පොහොට්ටු



2.8 රූපය: රෝස පෙති



2.9 රූපය: වැනිලා



2.10 රූපය: ගොරකා



2.11 රූපය: කුරුඳු




2.12 රූපය: වෙළඳ පොළෙහි දක්නට ලැබෙන අගය එකතු කළ තේ නිෂ්පාදන



## ක්‍රියාකාරකම - 2.2

01. තේ පානයේ අගය වැඩි කිරීම සඳහා යොදා ගත හැකි ද්‍රව්‍ය වැඩිහිටි සහය ඇති ව සොයා පන්තියට ගෙන එන්න.

02. ඔබගේ මිතුරන් සමග එක් වී තේ පානයේ රසය සහ ගුණය වැඩි කර ගැනීම සඳහා පහත වගුවෙහි අඩංගු ද්‍රව්‍ය එක්කර අගය එකතු කළ තේ පානයන් සකස් කර පන්තියට ඉදිරිපත් කර රස සංසන්දනය කර (✓) ලකුණක් යොදන්න.

| තේ සාම්පලය | ඉඟුරු | වැනිලා | ගොරකා | කුරුඳු | රෝස පෙති | පිච්ච පොහොට්ටු | විවිධ පලතුරු වර්ග (දොඩම්) |
|---|---|---|---|---|---|---|---|
| 01 | | | | | | | |
| 02 | | | | | | | |
| 03 | | | | | | | |
| 04 | | | | | | | |
| 05 | | | | | | | |
| 06 | | | | | | | |
| 07 | | | | | | | |
| 08 | | | | | | | |

## 2.3 තේ දල්ලයි සුව අරණයි......

**හැඳින්වීම**

තේ කියන්නේ කැෆේන් වැනි රසායනික සංයෝග අඩංගු ගුණදායි පානයකි. තේ පානය කිරීමෙන් සෞඛ්‍යමය ප්‍රතිලාභ රාශියක් අපිට ලැබෙනවා.

- උත්තේජකයක් ලෙස - ඒ කියන්නේ අපිට කම්මැලි හිතුණු වෙලාවක තේ බිව්වොත් ඒ ගතිය නැතිවෙලා යනවා.
- පිළිකා මර්දන කාරකයක් ලෙස
- හෘද රෝග මර්දන කාරකයක් ලෙස



Open Me
https://www.youtube.com/watch?v=K-vH4Lpj6-I

ඔබ දන්නවා ද ?
ආහාර ගත් විගස තේ පානය නුසුදුසුයි. මෙම පුරුද්ද ආහාර වල ඇති යකඩ අවශෝෂණයට බාධා ඇති කරනවා.



## ක්‍රියාකාරකම - 2.3

01. තේ පානය නිසා ඔබට ලැබෙන සෞඛ්‍යමය ප්‍රතිලාභ මොනවා ද?

.....................................................................................................
.....................................................................................................
.....................................................................................................

02. තේවල අඩංගු උත්තේජනය සඳහා දායක වන සංයෝගය කුමක් ද?

.....................................................................................................

03. අන්තර්ජාලය හෝ පොත්පත් ගවේෂණය කර තේ හා බැඳුණු සෞඛ්‍යමය ප්‍රතිලාභ පිළිබඳව කුඩා පොත් පිංචක් සකස් කරන්න.



**ඔබ දන්නවා ද?**
තේවල ශරීරයට හිතකර රසායනික සංයෝග බොහොමයක් තිබෙනවා. ඒ අතර පොලිපීනෝල, කැෆෙන්, ඇන්ටිඔක්සිඩන්ට් යන රසායනික සංයෝග තියෙනවා.



## දැන් මට පුළුවන් ...

ක්‍රියාකාරකම අවසානයේ පහත සඳහන් කර ඇති එක් එක් ක්‍රියාව ඔබ සිදු කර ඇති ප්‍රමාණය පිළිබඳ ඔබගේ අදහස අනුව ඊට ඉදිරියෙන් ඇති හිස්තැන මත √ ලකුණ යොදන්න.

සංවර්ධනය විය යුතු ය   සෑහීමකට පත් විය හැකි ය   සතුටුදායකයි

| | | | |
|---|---|---|---|
| තේ සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ සපයා ගැනීමට ඔබට පුළුවන් ද? | | | |
| තේ සෑදීමේ නිවැරදි පියවර අනුගමනය කිරීමට ඔබට පුළුවන් ද ? | | | |
| අගය එකතු කළ තේ සාම්පලවල රස හඳුනා ගැනීමට ඔබට පුළුවන් ද? | | | |

❖ ක්‍රියාකාරකම අවසානයේ ඔබගේ මොඩියුලය මිතුරෙකුට හෝ මිතුරියකට ලබා දී පහත සඳහන් කර ඇති එක් එක් ක්‍රියාව ඔබ සිදු කර ඇති ප්‍රමාණය පිළිබඳ ඔහුගේ/ ඇයගේ අදහස අනුව ඊට ඉදිරියෙන් ඇති ☆ ලකුණක් වටා රවුමක් අඳින්න.

★ සංවර්ධනය විය යුතු ය.   ★ සෑහීමකට පත් විය හැකි ය.

★ සතුටුදායකයි.   ★ ඉතා සතුටුදායකයි.

| | |
|---|---|
| ඔබගේ මිතුරා/මිතුරිය තේ සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ සපයා ගෙන තිබේ ද? | |
| ඔබගේ මිතුරා/මිතුරිය තේ සෑදීමේ නිවැරදි පියවර අනුගමනය කළා ද? | |
| ඔබගේ මිතුරා/මිතුරිය අගය එකතු කළ තේ සාම්පලවල රස හඳුනා ගත්තා ද? | |
| ඔබගේ මිතුරා/මිතුරිය තේ පානයෙන් ලැබෙන සෞඛ්‍යමය ප්‍රතිලාභ සඳහන් කර තිබේ ද? | |
| ඔබගේ මිතුරා/මිතුරිය කණ්ඩායම් හැඟීමෙන් යුතු ව අනෙකුත් අය සමඟ සහයෝගයෙන් වැඩ කටයුතු සිදු කළා ද? | |



## තක්සේරුකරණය

ඔබ සිදු කරන එක් එක් ක්‍රියාකාරකම අනුව ඔබගේ ගුරුභවතා විසින් පහත නිර්ණායක ඇසුරෙන් ඔබේ දැනුම, කුසලතා පිළිබඳ තක්සේරුකරණය සිදු කරනු ලැබේ.

### තක්සේරුව

| **නිර්ණායක** | 4 | 3 | 2 | 1 | **ලකුණු** |
|---|---|---|---|---|---|
| තේ සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ සපයා ගැනීම. | තේ සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ සියල්ල ම සපයා ගෙන ඇත. | තේ සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ කොටසක් සපයා ගෙන ඇත. | තේ සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ කිහිපයක් සපයා ගෙන ඇත. | තේ සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ සපයා ගෙන නැත. | |
| තේ සෑදීමේ නිවැරදි පියවර අනුගමනය කිරීම. | තේ සෑදීමේ නිවැරදි පියවර අනුගමනය කිරීම. | තේ සෑදීමේ දී අනුගමනය කරන පියවර දෙකක් නිවැරදි යි. | තේ සෑදීමේ දී අනුගමනය කරන පියවර එකක් නිවැරදි යි. | තේ සෑදීමේ දී අනුගමනය කරන පියවර සියල්ල ම වැරදි යි. | |
| අගය එකතු කළ තේ සාම්පලවල රස හඳුනා ගැනීම | තේ සාම්පල සියල්ලගේ ම රස නිවැරදි ව හඳුනා ගනියි. | තේ සාම්පල හයක රස නිවැරදි ව හඳුනා ගනියි. | තේ සාම්පල හතරක රස නිවැරදි ව හඳුනා ගනියි. | තේ සාම්පල දෙකක රස නිවැරදි ව හඳුනා ගනියි. | |
| තේ සෑදීමේ එක් එක් පියවරවල වැදගත්කම හඳුනා ගැනීම. | තේ සෑදීමේ පියවර සියල්ලගේ ම වැදගත්කම විස්තර කරයි. | තේ සෑදීමේ පියවර දෙකක වැදගත්කම විස්තර කරයි. | තේ සෑදීමේ එක් පියවරක වැදගත්කම විස්තර කරයි. | තේ සෑදීමේ කිසිදු පියවරක වැදගත්කම විස්තර නොකරයි. | |
| තේ පිළිගැන්වීමේ නිර්මාණාත්මකභාවය. | සුදුසු කෝප්පයක් භාවිත කර බන්දේසියක තබා නිර්මාණාත්මක ක්‍රමවේදයන් භාවිත කර තේ පිළිගන්වයි. | සුදුසු කෝප්පයක් භාවිත කර බන්දේසියක තබා තේ පිළිගන්වයි. | සුදුසු කෝප්පයක් භාවිත කර තේ පිළිගන්වයි. | තේ පිළිනොගන්වයි. | |

**මූළ ලකුණු**

1. සංවර්ධනය විය යුතු ය. 2. සෑහීමකට පත් විය හැකි ය. 3. සතුටුදායකයි.
4. ඉතා සතුටුදායකයි.





## 3. කොහේ ද මේ තේ වවන්නේ...?

මෙම ඒකකය අවසානයේ දී

- තේ වගාවට බලපාන ප්‍රශස්ත දේශගුණික තත්ත්ව විස්තර කිරීමට,
- ශ්‍රී ලංකාවේ තේ වගා කරන ප්‍රදේශ නම් කිරීමට,
- ලෝකයේ තේ වගා කරන රටවල් නම් කිරීමට,

ඔබට හැකියාවක් ලැබෙනු ඇත.

**හැඳින්වීම**

උඩරට තිළිය හැඩ වගේ
රතැඟිලි ඇගේ සැලෙන හැටි අගේ,

අගනුවර පාසලක 6 ශ්‍රේණියේ වාර්ෂික විනෝද චාරිකාව නුවරඑළිය ප්‍රදේශය නැරඹීමට සංවිධානය කරලා තිබුණා. විනෝද චාරිකාවේ දී දරුවන් ගී ගයමින් විනෝද වුණා. ඒ අතර දරුවෝ අවට සිරි නරඹනවා.



නදුන් : කසුන්, අර බලන්න එක යායට තේ වතු තියෙන හැටි.

කසුන් : ඔව් හරි ම ලස්සනයි. ඇයි ටීචර් මේ තේ ගස් අපේ පැත්තෙ වැවෙන්නේ නැත්තෙ?

ගුරුතුමිය : තේවලට අවශ්‍ය දේශගුණික සාධක ඒ පැත්තෙ නැහැනේ දරුවනේ.තේ ශාකය වැවෙන්න අවශ්‍ය උෂ්ණත්වය, වර්ෂාපතනය, වාතයේ තියෙන ජල වාෂ්ප ප්‍රමාණය වගේ දේවල් තියෙන්නෙ නුවරඑළිය, දෙනියාය, බදුල්ල වගේ ප්‍රදේශවල.

රවිඳු : එතකොට ටීචර්, අපේ රටේ විතර ද තේ වවන්නේ ?

ගුරුතුමිය : නැහැ දරුවෝ. ඉන්දියාව, චීනය, කෙන්යාව වගේ තවත් රටවල තේ වගා කරනවා.

ගුරුතුමිය : අර බලන්න තේ දළු නෙළන අය. ලංකාවේ තේ කර්මාන්තය නිසා ගොඩක් රැකියා අවස්ථා බිහි වෙලා තියෙනවා. ඔයාල දන්නව ද ඒවා මොනවද කියලා ?

නදුන් : ඔව් ටීචර්, අපේ මාමා තේ වතු අධිකාරි කෙනෙක්. අපේ ලොකු තාත්තා වැඩ කරන්නෙත් තේ පිටරට යවන තැනක.







Open Me
http://www.srilankateaboard.lk/index.php/features/the-importance-of-origin




**OPEN URL**
https://www.
dilmahconservation.org/pdf/
review-of-tea-industry-in-sl.pdf





3.1 රූපය: ලෝකයේ තේ වගා කරන රටවල්



## ක්‍රියාකාරකම - 3.1

01. දුවේ, පුතේ, දැන් ඔබ මිතුරන් සමඟ එක් කණ්ඩායමකට මිතුරන් දෙදෙනෙකු බැගින් වන සේ කණ්ඩායම් සාදා ගන්න.

- එක් එක් අවස්ථාවේ ගුරුවරයා පවසන දිස්ත්‍රික්කය, තේ වගා කරන දිස්ත්‍රික්කයක් නම් එය පන්තිය ඉදිරියේ ඇති ලංකා සිතියමෙහි ලකුණු කරන්න.
- ජයග්‍රාහී කණ්ඩායම තෝරා ගන්න.
- එම දිස්ත්‍රික්ක පහත සිතියමෙහි ලකුණු කරන්න.



02. අන්තර්ජාලය, පුස්තකාල පොත්, සිතියම් පොත් හා වැඩිහිටියකුගේ සහය ඇති ව සාම්ප්‍රදායික ව තේ වගා කරන රටවල් හා අලුතින් තේ වගාව ආරම්භ කළ රටවල් සොයා පහත වගුවේ සටහන් කරන්න.

| සම්ප්‍රදායික තේ වගා කරන රටවල් | අලුතින් තේ වගාව ආරම්භ කළ රටවල් |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

03. තේ වගා කරන ප්‍රදේශ අනුව තේ වගාවට සුදුසු දේශගුණික තත්ත්ව මොනවා දැයි සඳහන් කරන්න.

....................................................................................................

....................................................................................................

04. ඔබ ජීවත් වන ප්‍රදේශය තේ වගාව සඳහා සුදුසු වේ ද ? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

....................................................................................................

....................................................................................................

05. ඉහත ඔබ සොයා ගත් කරුණුවලට අදාළ ව ඔබේ ප්‍රදේශය තේ වගාවට සුදුසු වීමට හෝ නුසුදුසු වීමට හේතු පෝස්ටරයක් ආකාරයෙන් පන්තියට ඉදිරිපත් කරන්න.

## දැන් මට පුළුවන් ...

ක්‍රියාකාරකම අවසානයේ පහත සඳහන් කර ඇති එක් එක් ක්‍රියාව ඔබ සිදු කර ඇති ප්‍රමාණය පිළිබඳ ඔබගේ අදහස අනුව ඊට ඉදිරියෙන් ඇති හිස්තැන මත √ ලකුණ යොදන්න.

සංවර්ධනය විය යුතු ය   සෑහීමකට පත් විය හැකි ය   සතුටුදායකයි

| | සතුටුදායකයි | සෑහීමකට පත් විය හැකි ය | සංවර්ධනය විය යුතු ය |
|---|---|---|---|
| ඔබට ශ්‍රී ලංකාවේ තේ වැවෙන ප්‍රදේශ නම් කළ හැකි ද? | | | |
| ඔබට සාම්ප්‍රදායික ව තේ වගා කරන රටවල් නම් කළ හැකි ද? | | | |
| ඔබට අලුතින් තේ වගාව ආරම්භ කළ රටවල් නම් කළ හැකි ද? | | | |
| ඔබට තේ වගාවට සුදුසු දේශගුණික සාධක ප්‍රකාශ කළ හැකි ද? | | | |

❖ ක්‍රියාකාරකම අවසානයේ ඔබගේ මොඩියුලය මිතුරෙකුට හෝ මිතුරියකට ලබා දී පහත සඳහන් කර ඇති එක් එක් ක්‍රියාව ඔබ සිදු කර ඇති ප්‍රමාණය පිළිබඳ ඔහුගේ/ ඇයගේ අදහස අනුව ඊට ඉදිරියෙන් ඇති ☆ ලකුණක් වටා රවුමක් අඳින්න.

★ සංවර්ධනය විය යුතු ය.

★ සෑහීමකට පත් විය හැකි ය.

★ සතුටුදායකයි.

★ ඉතා සතුටුදායකයි.

| | |
|---|---|
| ඔබගේ මිතුරාට/මිතුරියට ශ්‍රී ලංකාවේ තේ වැවෙන ප්‍රදේශ නම් කළ හැකි ද? | ★ ★ ★ ★ |
| ඔබගේ මිතුරාට/මිතුරියට සාම්ප්‍රදායික ව තේ වගා කරන රටවල් නම් කළ හැකි ද? | ★ ★ ★ ★<br>★ ★ ★ ★ |
| ඔබගේ මිතුරාට/මිතුරියට අලුතින් තේ වගාව ආරම්භ කළ රටවල් නම් කළ හැකි ද? | ★ ★ ★ ★ |
| ඔබගේ මිතුරාට/මිතුරියට තේ වගාවට සුදුසු දේශගුණික සාධක ප්‍රකාශ කළ හැකි ද? | ★ ★ ★ ★ |
| ඔබගේ මිතුරා/මිතුරිය කණ්ඩායම් හැඟීමෙන් යුතු ව අනෙකුත් අය සමඟ සහයෝගයෙන් වැඩ කටයුතු සිදු කළා ද? | |

## පසු ක්‍රියාකාරකම


වැඩිහිටියෙකුගේ සහය ඇති ව ඔබ ප්‍රදේශයේ තේ වගාව හා සබැඳි රැකියා අවස්ථා සහ ග්‍රාමීය රැකියා නියුක්තිය පිළිබඳ දත්ත ලැයිස්තුගත කර ප්‍රස්තාරයක් මගින් තනි ව හෝ කණ්ඩායමක් ලෙස පන්තියට ඉදිරිපත් කරන්න. ඒ පිළිබඳ තොරතුරු පහත සඳහන් ස්ථානවලින් ලබා ගන්න.

- තේ සමිති
- ග්‍රාමසේවක කාර්යාලය

| තේ වගාව හා සබැඳි රැකියා අවස්ථා | කාන්තා රැකියා නියුක්තිය | පුරුෂ රැකියා නියුක්තිය | කාර්යභාරය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

දැන් ඔබ සොයා ගත් රැකියා සහ ඒවායේ නිරත වන පිරිස අනුව පහත ස්තම්භ ප්‍රස්තාරය වර්ණ ගන්වන්න.

**රැකියාවේ නිරත වන්නන් ගණන**




**තේ වගාව හා සබැඳි රැකියා අවස්ථා**

# ඉදිරි ගමනට අත්වැලක්

දුවේ, පුතේ, තේ වගාව පිළිබඳ ඔබ ලැබූ දැනුම භාවිතයෙන් පහත ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.








**හරහට**

01. නිමි තේ වර්ගයකි.
02. තේ පර්යේෂණ ආයතනය පිහිටා ඇත්තේ
03. ලෝකයේ ප්‍රධාන තේ නිෂ්පාදන රට වේ.
04. ඌව පළාතේ තේ වවන ප්‍රදේශයකි.
05. පහතරට, මැදරට වශයෙන් තේ වවන ප්‍රදේශ අනුව තේ වර්ග තුනකි.
06. තේ වෙළඳාම හා සම්බන්ධ ආයතනයකි.
07. තේවල රසය වැඩි කර ගැනීමට යොදා ගනී.
08. තේ වවන මධ්‍යම පළාතේ පිහිටි නගරයකි.

**පහලට**

01. ශ්‍රී ලංකාව අතීතයේ දී හැඳින් වූ නමකි.
09. තේ වගාවට අවශ්‍ය ප්‍රධාන දේශගුණික සාධකයකි.
10. තේ වගා කරන ආසියානු රටකි.
11. මසාලා තේ සෑදීමට යොදා ගන්නා අමුද්‍රව්‍යයකි.
12. වේවැල්වලට ප්‍රසිද්ධ උඩරට පිහිටි ප්‍රදේශයකි.
13. ප්‍රධාන තේ වර්ගයකි.
14. ශ්‍රී ලංකා වෙළඳ පොළේ ඇති ප්‍රධාන තේ වර්ගයකි.
15. ශ්‍රී ලංකා තේ වැඩිපුර ම මිලදී ගන්නා රටකි.